**ශීර්ෂ 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුලි 24 දින එම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 10,063 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 9,769 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 294 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 8,827 | 8,813 | 14 | 0.16 |
| මූලධන | 1,236 | 956 | 280 | 23.00 |
| **එකතුව** | **10,063** | **9,769** | **294** | **3.00** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11201 | 33 | 22 | 20 | 23 | 130 | 93 |

**2.3 අග්‍රිම ගිණුම්**

**--------------**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂ එකතුව රුපියල් මිලියන 746 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 7002/0000/000/0035/0008/000 | 61 |
| 7002/0000/000/0035/0009/000 | 27 |
| 7002/0000/000/0035/0010/000 | 649 |
| 7002/0000/000/0035/0011/000 | (480) |
| 7002/0000/000/0035/0012/000 | 87 |
| 7002/0000/000/0035/0013/000 | 31 |
| 7002/0000/000/0035/0014/000 | 370 |
| **එකතුව** | **746** |

**2.4 පොදු තැන්පත් ගිණුම්**

**------------------------**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රුපියල් මිලියන 1,186 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- |
| | **රු.මිලියන** |
| 6000/0000/00/0006/0071/000 | 32 |
| 6000/0000/00/0015/0025/000 | 1,154 |
| **එකතුව** | **1,186** |

**2.5 විගණන නිරීක්ෂණය**

**------------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින්

ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.16 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි (රථ වාහන හැර) |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 09 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2015 ජුනි 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.106,112,313 ක් විය.

**3.3 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.6,125,700 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 65 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) 2013 අංක 36 දරන විසර්ජන පනතේ 5(2) වගන්තියට පටහැනිව ශීර්ෂයේ එක් වැඩසටහකට සළසා තිබුණු මූලධන ප්‍රතිපාදනයෙන් ඉතිරි වූ රු.707,500 ක ප්‍රතිපාදන අනෙක් වැඩසටහනේ මූලධන ප්‍රතිපාදනයට මාරු කර තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම්**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුම් 07 කට අදාල ශේෂවල එකතුව රු.739,446,730 ක්වී තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 වන දිනට අග්‍රිම ගිණුම්වල ශේෂයන් එදිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයන් හා විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්ද ඇතුළත්ව රු.75,018,218 ක නොගැලපීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| අමාත්‍යාංශයේ පොත්වල දැක්වෙන අග්‍රිම ශේෂය | | 745,575,420 |
| නොපියවූ අත්තිකාරම් | 364,906,835 | |
| දූත මණ්ඩලවල අවසාන මුදල් ශේෂය | 305,650,367 | |
| අමාත්‍යාංශයේ තිබිය යුතු අග්‍රිම ශේෂය | | 670,557,202 |
| වෙනස | | 75,018,218 |

(ඇ) විසර්ජන ගිණුමේ සටහන (iii) අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ නොපියවූ උප අග්‍රිම (අත්තිකාරම්) එකතුව යටතේ කිසිම වටිනාකමක් දක්වා නොතිබුණද, අමාත්‍යාංශයේ (දූත මණ්ඩල ඇතුළුව) නොපියවූ අත්තිකාරම් රු.364,906,835 ක් හා දූතමණ්ඩල අවසාන මුදල් ශේෂය රු.305,650,367 ලෙස එකතුව රු.670,557,202 අනාවරණය කර නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා විදේශ දූත මණ්ඩල කාර්යාලවල නොපියවූ අත්තිකාරම් ශේෂය රු.364,906,835 ක් විය. විස්තරය පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම | කාල විශ්ලේෂණය | | |
|---|---|---|---|---|
| | | වර්ෂ 01 – 03 අතර | වර්ෂ 04 – 06 අතර | වර්ෂ 06 ට වැඩි |
| | රු. | රු. | රු. | රු. |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 5,147,944 | 38,171 | 309,773 | 4,800,000 |
| විදේශ දූතමණ්ඩල කාර්යාල | 359,758,891 | | | |
| විදේශ දූතමණ්ඩල කාර්යාලවල සැකැස්ම පහත පරිදි විය. | | | | |
| නොපියවූ ගමන් වියදම්අත්තිකාරම් | 4,820,047 | 3,232,888 | 1,049,867 | 537,292 |
| විශ්‍රාම වැටුප් | 12,387,247 | -- | 12,387,247 | -- |
| බැංකු ඇපකර | 20,061,453 | 14,006,886 | 3,623,054 | 2,431,513 |
| වැටුප් අත්තිකාරම් | 398,969 | 75,790 | 172,831 | 150,348 |
| ආරක්ෂිත ඇප තැන්පතු | 208,106,609 | 107,574,169 | 47,509,030 | 53,023,410 |
| හඳුනානොගත් තැන්පතු | 113,984,566 | 44,036,263 | 34,793,292 | 35,155,011 |

අමාත්‍යාංශයේ අත්තිකාරම් ශේෂය තුළ 2010 දෙසැම්බර් 31 දින ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබාදෙන ලද රු.309,773 ක ශේෂයක් තිබූ අතර, මෙය වසර 05 ඉක්මවා ගියද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය තුළ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ කටයුතු වෙනුවෙන් ලද රු.448,000,000 ක් වර්ෂ අවසාන වන විටත් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව පොදු තැන්පත් ගිණුමේ ශේෂය 1,153,581,743 ක් වූ අතර කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු.1,161,011,502 ක් වී තිබුණි. ඒ අනුව රු.7,429,759 ක වෙනසක් විය.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 11201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,221,212 ක්වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයේ පැවතුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.7.3 විගණන හා කළමනාකරණ කමිටුව

2014 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 02 ක් පවත්වා තිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) සන්ධාන අංශයට අවශ්‍ය රාජකාරියක් යැයි සඳහන්ව 2014 පෙබරවාරි 28 දින රු.50,840 ක් ගෙවා ජංගම දුරකථන 16 ක් මිලදී ගෙන තිබුණි. අදාල කටයුත්තෙන් පසුව එම දුරකථන ගබඩාවට ආපසු භාරදී තිබූ අතර, විගණන පරීක්ෂණ දිනය වූ 2014 සැප්තැම්බර් 10 දින වන විටත් එම දුරකථන නිෂ්ක්‍රීයව කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ගබඩාවේ තබා තිබුණි.

(ii) ඕස්ට්‍රේලියාවේ පිහිටි මෙල්බන් දූත මණ්ඩලය සතු ඕස්ට්‍රේලියානු ඩොලර් (A$) 2,589,000 ක වටිනාකමැති ගොඩනැගිලි 02 ක් වර්ෂ 1-6 ත් අතර කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

-----------------------------

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.662,056,694 ක් වූ අතර, විගණනය සඳහා ඉදිරිපත් කළ බැරකම් ලේඛනයේ කාල වකවානු ඇතුළත් කර නොතිබුණි.

## 3.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 751 | 746,422 | මිලදී ගෙන තිබුණු ටෝනර් අදාල තොග පොතට ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 754 | 1,688,273 | (i) 2013 වර්ෂයේ අවසාන ටෝනර් තොග ශේෂයන් 2014 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස අළුත් තොග පොතට ගැනීමේදී සමහර තොග ශේෂයන් අඩුවෙන් දක්වා තිබුණි. එසේ අඩුවෙන් දක්වා තිබුණු තොගයේ වටිනාකම රු.1,688,273 ක් විය. |
| | 861,535 | (ii) 2013 වර්ෂයේ අවසන් ටෝනර් තොග ශේෂයන් 2014 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙසට ඉදිරියට ගෙනවිත් තිබේද යන්න බැලීමේදී රු.861,535 ක ටෝනර් තොග ශේෂයන් 2014 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඉදිරියට ගෙන යන බවට තොග පොත් යොමුව දක්වා තිබුණත්, අදාල තොග පොත් යොමුව |

| | | |
|---|---|---|
| | | පරීක්ෂා කිරීමේදී එවැනි තොග ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙසට 2014 වර්ෂයේ ටෝනර් තොග පොතේ සටහන් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන චක්‍රලේඛය | | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිලධාරීන් 11 දෙනෙකුට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය නොමැතිව ජංගම දුරකථන මිලදී ගෙන බෙදා දී තිබුණි. එයින් ජංගම දුරකථන 08 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේද සටහන් කර නොතිබුණි. |
| (ii) 1990 මැයි 18 දිනැති අංක 26/90 දරන චක්‍රලේඛය | 341,627 | උත්සව කටයුතුවලදී මත්පැන්වලින් සංග්‍රහ කිරීම නොකළ යුතු බවත්, මෙම රීතිය තරයේ පිළිපැදිය යුතු බවත් දක්වා තිබුණද, ඉහත චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිවඅමාත්‍යාංශය විසින් මත්පැන්වලින් සංග්‍රහ කිරීම සඳහා රු. 341,627 ක් වියදම් කර තිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2003 මාර්තු 28 දිනැති අංක MF/TR/1/2003 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය | 40,000 සිට 90,000 දක්වා | අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයට පටහැනිව 2014 ඔක්තෝබර් මාසය වන විට මාසික කුලී පදනම මත වාහන 14 ක් ලබාගෙන තිබුණි. |
| **(ඈ) අමාත්‍යාංශ චක්‍රලේඛ** | | |
| (i) අමාත්‍යාංශ උපදෙස් මාලා 166 | 5,126,638 | ගුවන් ගමන් බලපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී අමාත්‍යාංශය මඟින් පූර්ව අනුමැතියක් හා මුදල් ප්‍රතිපාදන |

| | | | |
|---|---|---|---|
| | | | ලබාගත යුතු වුවද, දූත මණ්ඩල කාර්යාල 06 ක් විසින් ගෙවන ලද ගුවන් ටිකට්පත් සඳහා එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) | 2001 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍යාංශ උපදෙස් මාලා අංක 178 | 12,649,723 | දූත මණ්ඩල මඟින් ගුවන් ටිකට්පත් මිලට ගැනීමේදී ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා තිබෙන පහසුව හා ලාභදායී මාර්ගයේ ගමන් කිරීම සඳහා මිලකැඳවීම් ලබාගෙන අදාල සේවා සපයන්නා තෝරාගත යුතු වුවත්, දූත මණ්ඩල 08 ක් විසින් මිලදී ගෙන තිබෙන ගුවන් ටිකට්පත් සඳහා මිලකැඳවීම් ලබාගෙන තිබූ බවට තොරතුරු අනාවරණය නොවීය. |
| (iii) | 2009 සැප්තැම්බර් 28 දිනැති අංක 261 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 සැප්තැම්බර් 04 දිනැති අංක FA/OMA/E4/2009 දරන චක්‍රලේඛය | 146,503 | යැංගුන් තානාපති කාර්යාලයේ නිලධාරීන් තුන්දෙනෙකුගේ වැටුප පමණක් එක්සත් ජනපද ඩොලර්වලට පරිවර්තනය කර ගෙවිය යුතු වුවත්, වැටුප සමග ගෙවා තිබුණු සියයට 15 දීමනාවද එක්සත් ජනපද ඩොලර්වලට පරිවර්තනය කර ගෙවා තිබුණි. |

## 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) කල් ඉකුත් වූ චෙක්පත්

2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ බැංකු ගිණුමක නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිපත් වී නොතිබුණු මාස 06 කට වඩා කල් ඉකුත් වූ රු.888,390 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව 2015 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. තවද දූත මණ්ඩල 09 කට අදාලව බැංකු ගිණුම් 12 ක

මාස හය ඉක්මවූ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් ඉහත රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) නොසැසඳු ශේෂයන්**

-----------------------

දූත මණ්ඩල 09 ක් විසින් බැංකු ගිණුම් 12 කට අදාලව 2014 දෙසැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණත්, එමගින් අනාවරණය වූ නොසැසදීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනිම නිසා බැංකු සැසඳුම් පිළියෙල කිරීම මඟින් අපේක්ෂිත මුදල් පාලනය සිදු වි නොතිබුණි.

**(ඇ) බැංකු හර කිරීම්**

-------------------

දූත මණ්ඩල කාර්යාල 09 ක බැංකු ගිණුම් 11 ක බැංකුව විසින් කරන ලද ගෙවීම් හා දූතමණ්ඩල කාර්යාල 09 ක බැංකු ගිණුම් 18 කට ඍජුවම වූ ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සාක්ෂි ඉදිරිපත් නොවීම

---------------------------

දූතමණ්ඩල කාර්යාල 03 ක බැංකු සැසඳුම් ප්‍රකාශ 03 ක සඳහන්ව තිබුණු වටිනාකම් තහවුරු කෙරෙන උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) වොෂින්ටන් තානාපති කාර්යාලය

--------------------------------------

2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ 2006 වසරේ තැන්පත් කරන ලද උපලබ්ධි නොවූ USD 1,035 ක වටිනා තැන්පතු සහ හඳුනා නොගත් ගෙවීම් USD 20,212 ක් පවතින බව නිරීක්ෂණය විය. තවද බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් තැන්පතු USD 2,583 ක ශේෂයක් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ලොස්ඇන්ජලීස් කොන්සියුලර් ජනරාල් කාර්යාලය

---------------------------------------------------------

2011 ඔක්තෝබර් 03 දින සොරාගන්නා ලද USD 1,583 ක මුදල සම්බන්ධයෙන් හානි හා පාඩු ලෙස සළකා කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම බැංකු සැසඳුමෙහි පෙන්වා තිබිණි.

(උ) බ්‍රසීලයා තානාපති කාර්යාලය

BRL ගිණුම සඳහා වන බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් ගැලපුම් කර තිබූ පහත ගනුදෙනු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | බ්‍රසීල් රියල් |
|---|---|
| මුදල් පොතේ වැරදි ගණනය කිරීම් | 2,297 |
| වැඩිපුර ඉවත්කර ගැනීම් | 2,003 |
| බැංකුගත කළ නමුත් උපලබ්ධි නොවූ නොවැම්බර් මාසයේ ලැබීම් | 418 |

(ඌ) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල නොකිරීම

2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ඉරාන තානාපති කාර්යාලයේ ඇ.එ.ජ. ඩොලර් 1,040 ක ශේෂයක් පැවතුණු අතර, ඒ සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. ඉරාන රජයේ පවතින නීතිය අනුව එරට බැංකු විසින් ඇ.එ.ජ. ඩොලර් ගනුදෙනු සිදු කරනු නොලබන බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි.

(ඒ) අක්‍රීය බැංකු ගිණුම

නිව්යොක් තානාපති කාර්යාලය මඟින් පවත්වාගෙන යනු ලබන 15 A දරන බැංකු ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට රු.488,439 (ඇ.එ.ජ. ඩොලර් 4,386) ශේෂයක් පැවති අතර අමාත්‍යාංශය විසින් එම බැංකු ගිණුම ක්‍රියාත්මක නොවන බව දන්වා තිබුණි.

3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අයථා පරිහරණය කරන ලද මුදල්

අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල DGSA 7 ආකෘතියේ පාඩු හා අත්හැරීම් යටතේ රු.25,836,766 ක් නිරවුල් නොකර දිගින් දිගටම පෙන්වා තිබුණි. 2009 වර්ෂයේදී රෝම තානාපති කාර්යාලයේ සිදු වී තිබුණු අයථා පරිහරණය කළ මුදල රු.16,141,919 ක්ද, එම පාඩු හා අත්හැරීම් යටතේ ඇතුළත්ව තිබුණි.

**(ආ) හෝටල් ගාස්තු ගෙවීම්**

අමාත්‍යාංශයේ නිලධාරීන් 27 දෙනෙකු 2012 ජූලි 10 දින පාසිකුඩාහි පැවැති වැඩසටහනකට සහභාගීවී පාසිකුඩාහි පිහිටි අවන්හලකින් එදින උදේ ආහාරය ලබා ගෙන තිබුණි. ඒ සඳහා 2012 ජූලි 10 දින රු.18,000 ක් බිල්පතක්ද, ඒ වෙනුවෙන්ම 2013 සැප්තැම්බර් 27 දින රු.27,000 ක බිල්පතක්ද එවා තිබුණි. එකම කාරණයකටම බිල්පත් දෙකක් ඉදිරිපත් කර තිබීමත්, අමාත්‍යාංශය විසින් එහි වටිනාකමෙන් වැඩි බිල්පත වෙනුවෙන් වර්ෂයකට වැඩි කාල පමාවක පසු 2014 ජනවාරි 13 දින ගෙවා තිබීම මතභේදාත්මක විය.

**(ඇ) දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සඳහා ගෙවීම**

දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සඳහා වූ වියදම් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් විය.

(i) ප්‍රදර්ශන වෙළෙඳ කුටියේ අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ මිල ගණන් විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුවේ නොතිබුණි. මේ නිසා ලංසුකරුවන් ඉදිරිපත් කළ මිල ගණන් සැසඳීමේ ලේඛනයට ඇතුළත් කර ඇති බව විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ii) බිම ඇතිරිලි (Carpets) සඳහා පළමු ගෙවීම තුළම රු.846,000 ක මිලක් ඇතුළත් කර ව්‍යාපෘති උපදේශක අනුමත කර තිබියදී, අවසන් බිලෙහි එහි මිල රු.1,307,957 ක් ලෙස රු.461,957 කින් වැඩි කර තිබුණි.

(iii) ඇතිකරගත් ගිවිසුමෙහි අංක 39:2 වගන්තිය අනුව ගිවිසුම්ගත අගයේ වෙනස මිලියනය නොඉක්මවිය යුතු බව සඳහන් වුවද, වැඩ අවසන්ව ගෙවීම් කිරීමේදී රු.2,108,822 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද ගිවිසුම් මුදලේ විචලනයන් විශ්ලේෂණය සඳහා රැස්වූ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා මඟින් ගිවිසුම්ගත මුදලේ වැඩිවීම සාධාරණීකරණය කොට වැඩිකළ මුදලද සමඟ ඉතිරි ශේෂය ගෙවීම නිර්දේශ කර තිබුණද, එම නිර්දේශය සඳහා කමිටුවේ සාමාජිකයන් තිදෙනාගෙන් දෙදෙනෙකු අත්සන් කර නොතිබූ අතර, එක් අයෙකු පමණක් අත්සන් කර තිබුණි. මෙම නිර්දේශයේ වලංගුතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. තවද රජය විසින් දින දෙකකින් ප්‍රදර්ශන

කාලය දීර්ඝ කිරීම නිසා කුලී පදනම මත ගත් අයිතම වෙනුවෙන් සහ අමතර අයිතම වෙනුවෙන් යැයි සඳහන්ව රු.2,108,822 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 3.12 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මෙම අමාත්‍යාංශය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව 2014 සැප්තැම්බර් 30 දින වන විට කුලී වාහන 08 ක් ලබාගෙන තිබූ අතර, ඇතැම් වාහන අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ට අයත් ඒවා බවද නිරීක්ෂණය විය.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණය ඉදිරිපත් කිරීම මත පමණක් අදාල කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 ක උපරිම අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි වුවද, අමාත්‍යාංශය කොඩි මිලදී ගැනීම සඳහා වූ ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 50 ක හෙවත් රු.826,250 ක් ගෙවා තිබුණි. එම කොඩි අමාත්‍යාංශ ගබඩාවට ලැබී ඒ හරහා නිකුත් කර ඇති බව තහවුරු නොවූ බැවින් සත්‍ය වශයෙන්ම මිලදීගත් කොඩි ප්‍රමාණය අමාත්‍යාංශයට ලැබුණේද යන්න තහවුරු කර ගැනිමට නොහැකි විය.

### 3.13 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) තාක්ෂණික උපදේශන සේවා ලබා ගැනීම

2009 ජනවාරි මාසයේ සිට 2015 අගෝස්තු මාසය දක්වා අමාත්‍යාංශයේ වාහන 98 ක අළුත්වැඩියා සඳහා තාක්ෂණ උපදේශන සේවය ලබා ගැනීමට නිලධාරියෙකු බඳවා ගැනිමට කටයුතු කර නොතිබුණි. මේ සඳහා රජයේ සංස්ථාවක ප්‍රවාහන නිලධාරියාගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් 2009 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා මාසිකව රු.5,000 බැගින් එකතුව රු.290,000 ක් ගෙවා තිබුණි. 2014 ජනවාරි සිට 2015 අගෝස්තු දක්වා එම සේවය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ මුලිකගෙන් ලබා ගෙන තිබුණි.

(ආ) අධි සුඛෝපභෝගී බස්රථ දෙකක් මිලදී ගැනීම

---

අත්පිට විකුණුම් මිල රු.35,900,000 ක් වූ බස් රථ දෙකක් කල් බදු ක්‍රමය යටතේ රු.55,005,120 කට 2013 නොවැම්බර් 01 දින සිට මාසික වාරිකය රු.916,752 ක් බැගින් වාරික 60 කින් ගෙවීමේ පොරොන්දුව මත ලබා ගෙන තිබුණි. ඒ අනුව අත්පිට විකුණුම් මිල ඉක්මවා රු.19,105,120 ක් ගෙවීමට අමාත්‍යාංශයට සිදු වී තිබුණි. 2015 අගෝස්තු මාසය වන විට බස් රථ දෙකින් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ආවරණයක් රහිතව අමාත්‍යාංශ භූමියේ නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ඇ) විදේශ සේවය අවසන් කර නැවත පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මලු වරායෙන් නිදහස් කර ගැනීම

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශ සේවය අවසන් කර නැවත පැමිණෙන නිලධාරීන්ගේ 2014 වර්ෂයේදී ගමන් මළු නිදහස් කර ගැනීමේ මුළු ගෙවීම රු.12,784,674 ක් වි තිබුණු අතර ඉන් සියයට 29 ක් හෙවත් රු.3,735,164ක් වූ ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදු වී තිබුණි. තවද මෙම සමස්ථ අධිභාර වටිනාකම බහලුම් මෙහෙයුම් කරනු ලබන දේශීය රාජ්‍ය ආයතනයක් වෙත රු.1,660,520 ක්ද, විදේශ සමාගම් දෙකකට රු.1,839,093 ද, බහලුම් සේවා සපයන පෞද්ගලික ආයතන සඳහා රු.235,551ක් ද ලෙස ගෙවා තිබුණි.

(ii) නිදහස් කරන ලද ගමන් මලු සඳහා ගෙවීම් කිරීමේදී අදාල වියදම් සත්‍ය වශයෙන්ම ඒ ඒ ගමන් මලුවලට අදාල ඒවාද යන්න තහවුරු කර ගැනීම සඳහා වන ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් හඳුන්වාදී නොතිබුණි.

(iii) අදාල වියදම් සත්‍ය වශයෙන් එම එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් පැන නැගුණ ඒවාද යන්න තහවුරු කර ගැනීම සඳහා මූලික වශයෙන් අදාල වන කිසිදු ගෙවීම් වවුචරයක නෞභාර පත හෝ ප්‍රතිපූර්ණය කළ රු.137,182 ක ගෙවීම්වලට රිසිට්පත හෝ බිල්පත් අමුණා නොතිබුණි.

(iv) ඉන්වොයිස් නොමැතිවීම නිසා රු.104,876 ක් වූ බිල්පත් සත්‍ය වශයෙන්ම අමාත්‍යාංශයට අදාල බිල්පත්ද යන්න හෝ ගෙවන ලද මුදල නිවැරදිද යන්න හෝ තහවුරුකර ගත නොහැකි විය.

(v) නිලධාරීන් ගමන් මලු රැගෙන ඒමේදී ඒ සඳහා කුලියට ගන්නා ලද බහලුම් වෙනුවෙන් තබා ඇති තැන්පතු නැවත ගැනීම හෝ නිශ්කාෂණ නියෝජිතයාට

ගෙවීම් කිරීමේදී එම මුදල අඩුකළ යුතු වුවත්, බහලුම් 07 ක් සම්බන්ධයෙන් රු.49,000 ක තැන්පතු එලෙස අයකර ගෙන නොතිබුණි.

(vi) ගමන් මලු නිදහස් කර ගැනීමේදි ප්‍රතිපූර්ණය කර තිබූ රු.335,015 ගෙවීම් පිළිබඳව විස්තර නොමැති වීම නිසා පරික්ෂා කළ නොහැකි විය.

## 3.14 විගණන හා කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක නොකිරීම

අමාත්‍යාංශය තාක්ෂණ උපදේශන සේවයද ඇතුළත්ව ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් 03 ක් පළ කළ නමුත් 2015 වර්ෂය ආරම්භය වනවිටත් එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකි වී තිබුණි. 2013 ජූලි 25 දින හා 2014 ජනවාරි 16 දිනැති විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡාවේදී මෙම තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් පෙන්වාදී තිබුණ අතර, අධ්‍යක්ෂ (පාලන) විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණු නමුත් එසේ කර නොතිබුණි.

## 3.15 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 1.9 | වාහන 08 කට සිදුවූ අලාභ හානි පිළිබද විස්තර ගිණුමේ අනාවරණය නොවීම හා මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු නොකිරීම. |
| 2013 | 1.10 | විදේශ දූතමණ්ඩල සේවය අවසන් කර නැවත ලංකාවට පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මලු වරායෙන් නිදහස් කර ගැනීමේදී දඩ මුදල් ගෙවීමට අදාල චක්‍රලේඛ නිකුත් නොකිරීම. |
| 2013 | 1.11 | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විදේශ සේවා නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සළසා දීම සඳහා නිවාස සංවර්ධන අධිකාරියෙන් 2006 වසරේ සිට 2012 |

වසර දක්වා රු. මිලියන 70 ක් ගෙවා මිලදී ගෙන තිබුණු නිවාස 20 හි අයිතිය තහවුරුකිරීම සඳහා වූ ඉඩම් ඔප්පු නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන නොතිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 406 | 354 | 52 |
| (ii) තෘතියික මට්ටම | 148 | 123 | 25 |
| (iii) ද්විතියික මට්ටම | 918 | 839 | 79 |
| (iv) ප්‍රාථමික මට්ටම | 1,301 | 1,197 | 104 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 15 | 12 | 03 |
| එකතුව | 2,788 | 2,525 | 263 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 263 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### (ආ) වාර්ෂික ස්ථාන මාරුවීම් පරීක්ෂාව

2014 ජූනි 26 දිනැති අංක 02/2014 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ 5.2 (ඇ) ඡේදය පරිදි 2014 දෙසැම්බර් 31 දිනට එකම ආයතනයක වසර 05 ට වඩා සේවය කළ නිලධාරීන්ගේ නාම ලේඛනයක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු අතර එහි 8.2 ඡේදයට පටහැනිව අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කර තිබුණු ඒකාබද්ධ සේවාවන්වල වසර 05 ඉක්ම වූ නිලධාරීන්ගේ නාමලේඛනයට අවුරුදු 06-19 දක්වා සේවය කළ නිලධාරීන් 36 කගේ තොරතුරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි.

(ඇ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**-----------------------------------------------------------**

අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොපැවතියදී 2011 ජනවාරි 18 දින සිට 2014 මාර්තු මාසය දක්වා අමාත්‍යතුමාගේ මාධ්‍ය කටයුතු සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොදු සහකාර තනතුරක සේවය කරන නිලධාරියකු සේවයේ යොදවා තිබූ අතර ඒ වෙනුවෙන් රු.1,107,021 ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවා තිබුණි.